[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம்
මතුගම අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - ඉතිහාසය | පත්‍රය I | පැය - 01 යි. |
|---|---|---|---|

නම ....................................................................................................

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති පිළිතුරුඅතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකය හිස්තැනෙහි යොදන්න.**

01) අතීත වියතුන් විසින් විවිධ කාල වකවානුවල ලියන ලද ග්‍රන්ථ හා ලේඛන අයත් වන්නේ කුමන මූලාශ්‍ර වර්ගයට ද?
1). නාණක මූලාශ්‍ර 3). පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර
2). සාහිත්‍ය මූලාශ්‍ර 4). පුරා වස්තු (......)

02) මෙරට දේශපාලන තොරතුරු ඇතුළත් ව ඇති ග්‍රන්ථයක් වන්නේ,
1). බෝධිවංශය 3). පූජාවලිය
2). රාජාවලිය 4). නිකාය සංග්‍රහය (......)

03) මෙරටින් හමුවන පැරණිතම කාසි හඳුන්වනු ලබන්නේ,
1). රන්මසු 2).කහාපණ 3). රිදී කාසි 4). අක කාසි (......)

04) වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථායක් වූ මිනිහාගල්කන්ද අයත්වන පරිසර කලාපයකි.
1). තෙත් කලාපය 3). පහතරට වියළි කලාපය
2). අර්ධ ශුෂ්ක කලාපය 4). ශුෂ්ක කලාපය (......)

05) ප්‍රාග් ඓතිහාසික මානවයින් ලුණු භාවිතා කළ බවට සාධක ලැබෙන ස්ථානයක් ඇතුළත් පිළිතුර වන්නේ,
1). කිතුල්ගල බෙලිලෙන 3). රාවණා ඇල්ල ලෙන
2). පාහියන්ගල ලෙන 4). කුරුවිට බටදොඹලෙන (......)

06) තාක්ෂණික වශයෙන් සංක්‍රාන්තික යුගයක් ලෙස සලකනු ලබන්නේ,
1). ප්‍රාග් ඓතිහාසික යුගයයි. 3). මුල් ඓතිහාසික යුගයයි.
2). පූර්ව ඓතිහාසික යුගයයි. 4). ඓතිහාසික යුගයයි. (......)



EXAMRESULTS.LK

07) ඌව පළාතේ පිහිටි පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසානභූමි දෙකක පුරාවිද්‍යාත්මක කැණීම් සිදුකොට ඇති ස්ථාන වලට නිදසුන් ලෙස දැක්විය හැක්කේ,

1). ඉබ්බන්කටුව හා යටිගල්පොත්ත
2). හල්දුම්මුල්ල හා බෙරගල
3). බෙරගල හා යටිගල්පොත්ත
4). ඉබ්බන්කටුව හා බෙරගල (......)

08) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්ති කලාපයේ ව්‍යාප්ත වීමට බලපෑ ප්‍රධාන හේතුවක් වන්නේ,

1). පසේ සාරවත් බවයි.
2). ස්වභාවික සම්පත්වල ව්‍යාප්තියයි
3). වර්ෂාව නියමිත පරිදි ලැබීමයි.
4). ජල වහනනයි. (......)

09) තිස්සමහාරාම වැව ඉදිකළ රජතුමා ලෙස සැලකෙන්නේ,

1). තිස්ස රජුය
2). වසභ රජුය
3). මහානාග රජුය
4). ඉළනාග රජුය (......)

10) පට්ටනගාම යනුවෙන් දැක්වෙන්නේ,

1). වඩුවන් විසූ ගම් ය
2). වරාය ආශ්‍රිතව තිබූ ගම් ය
3). ධීවරයින් විසූ ගම් ය
4). ගොවියන් විසූ ගම් ය (......)

11) අතීතයේ එල්ලංගාව වැනි වැව් පද්ධති නිර්මාණය කිරීමේ එක් අරමුණක් වන්නට ඇත්තේ,

1). ජලය සංරක්ෂණය කර ගැනීමය
2). පාංශු ඛාදනය වලක්වා ගැනීමය
3). ගංවතුර පාලනය කර ගැනීමය
4). දේශගුණයේ සමබරතාව රැක ගැනීමය (......)

12) අපේ පුරාවස්තු රැකගැනීම වඩාත් වැදගත් වන්නේ ඒවා,

1). මිල කළ නොහැකි දේවල් නිසා ය.
2). අතීතයට අයත් දේවල් නිසා ය.
3). විදේශ සංචාරකයින්ට පෙන්විය හැකි නිසා ය.
4). දේශීය උරුමය ප්‍රදර්ශනය කිරීමට හේතුවන නිසා ය. (......)

13) රජුගේ ප්‍රධාන කාර්යභාරය බවට පත් **නොවූ** කාර්යය මින් කුමක් ද?

1). රටක් ආර්ථික වශයෙන් දියුණු කිරීම.
2). රටක වැසියාගෙන් අනිවාර්ය බදු අය කිරීම.
3). රට වැසියාට ආරක්ෂාව සැපයීම.
4). ජනතා ආධ්‍යාත්මය පෝෂණය කිරීම. (......)

14) දිවයිනේ නොයෙක් ප්‍රදේශවල සෙල්ලිපි පිහිට වූ ලම්භකර්ණ වංශික රජු කවු ද?

1). වසභ රජු
2). මහසෙන් රජු
3). කාශ්‍යප රජු
4). එළාර රජු (......)

15) ශ්‍රී ලංකාව රතුකැට දිවයින ලෙස සඳහන් කර ඇත්තේ කවරෙකු විසින් ද?

1). අරාබි ජාතික ඉබන්බතූතා
2). අරාබි ජාතික අල්බලසූරි
3). ග්‍රීක ජාතික ටොලමි
4). චීන ජාතික හියුන්සාං (......)

16) පුරාණ කාලයේ මහවැලි ගඟේ අතු ගංගාවක් වන අඹන් ගඟ හරස්කර ඉදිකර ඇති දැවැන්ත ඇළමාර්ගය වන්නේ,

1). මිනිපේ ඇළයි. 3).යෝධ ඇළයි
2). පබ්බතන්ත ඇළයි 4). ඇළහැර ඇළයි (......)

17) අතීතයේ සිටම අන්තර්ජාතික වෙළඳ කටයුතුවලදී අපේ රට වැදගත් වැඩ කොටසක් ඉටු කළේය. ඊට ප්‍රධාන හේතුවක් වූයේ,

1). ඉන්දියානු සාගරයේ දූපතක්ව පිහිටීමයි.
2). අපනයන භෝග වෙළඳාම අතීතයේ සිටම පැවතීමයි.
3). ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීමයි.
4). ශ්‍රී ලාංකිකයන් වෙළඳාම ප්‍රධාන ජීවන වෘත්තිය ලෙස සැලකීමයි. (......)

18) වැව් පද්ධතියක් සහ ඊට අයත් ගම් කිහිපයක ජීවත් වූ වැසියන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් තීරණ ගැනීමට බලයක් පැවරී තිබුනේ,

1). පරුමකවරුන්ටය. 3). සේනානිවරුන්ටය.
2). ගමික වරුන්ටය. 4). දසගම් ඇත්තන්ටය. (......)

19) පැරණි ශ්‍රී ලංකාවේ ගොවියන් විසූ ගම් හැඳින්වූ නම වන්නේ,

1). මණිකාරගාම 3). කුම්භකාරගාම
2). කේවට්ටගාම 4). කසීකාරගාම (......)

20) ශ්‍රී ලංකාවේ දේශපාලන බලයේ විකාශනය ආරම්භ වූයේ බලය බෙදී ගිය ක්‍රමයක් ලෙසය. එවැනි ක්‍රමයක් හඳුන්වන්නේ,

1). මධ්‍යගත පාලන ක්‍රමය 3). ඒකීය පාලනය
2). විමධ්‍යගත පාලනය 4). රාජාණ්ඩු පාලනය (......)

21) වැවක බිසෝකොටුව මඟින් ඉටුවන කාර්යය වන්නේ,

1). වැවෙහි අතිරික්ත ජලය පිට කිරීමයි.
2). වැව් බැම්ම සෝදියාම වැළැක්වීමයි.
3). වැවට රොන්මඩ ඒම වැළැක්වීමයි.
4). සොරොව්ව මඟින් ඇතිවන ජලපීඩනය වැළැක්වීමයි. (......)

22) ශ්‍රී ලංකාවේ නිවාස ඉදිකිරීම පිළිබඳ සාක්ෂි අපට හමුවන්නේ පූර්ව ඓතිහාසික යුගයේ දීය. ක්‍රි.ව.1129 දී එවැනි නිවසක නටබුන් හමු වී ඇති දිස්ත්‍රික්කය වන්නේ,

1). රත්නපුර 2). මහනුවර
3). හම්බන්තොට 4). කළුතර (......)

23) පත්තිනි දේවාලයක් විවෘත කිරීම සඳහා දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට ගියා යැයි සැළකෙන අනුරාධපුර රාජ්‍ය පාලකයා කවුරුන්ද?

1). ඉළනාග රජු 2). මානවම්ම රජු 3). මහසෙන් රජු 4). ගජබා රජු
(......)

24) පහත දී ඇති ප්‍රකාශ අතුරින් අනුරාධපුර යුගය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

1).ශ්‍රී ලංකාවට බුදුදහම ගෙනඒම
2). මහසෙන් රජතුමා මින්නේරිය වැව ඉදිකිරීම
3). කාලිංග මාඝ විසින් මෙරට ප්‍රදේශ ආක්‍රමණය කිරීම
4). වළගම්බා රජතුමා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම (......)

25) සැළසුම, තාක්ෂණය හා අලංකරණය යන කරුණු අතින් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම නාගරික උද්‍යානය ලෙස සැළකෙනුයේ,

1). සීගිරි උද්‍යානයයි
2). රන්මසු උයනයි
3). මහමෙවුනා උයනයි
4). පේරාදෙණිය උද්‍යානයයි (......)

**අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවල "අ" සහ "ආ" කොටසේ ඇති සම්බන්ධතාවය අනුව ගැලපූ විට පිළිතුර තෝරන්න.**

26) පහත සඳහන් "අ" හි සඳහන් තොරතුරු "ආ" සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර ඇතුළත් අංකය වන්නේ,

| අ | ආ |
|---|---|
| 1). යකඩ භාවිතය | A ඓතිහාසික යුගය |
| 2). ගල් මෙවලම් භාවිතය | B පූර්ව ඓතිහාසික යුගය |
| 3). ගංහා හරහා අමුණු බැඳීම | C ප්‍රාග් ඓතිහාසික යුගය |

1).ABC 2). BCA 3). ACB 4). CBA (......)

27) පහත සඳහන් නිලතල වලින් හඳුන්වන පුද්ගලයින් නිවැරදිව ගැලපූවිට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1). පවුලක ප්‍රධානියා | A ගමික |
| 2). වැව් අංශයේ ප්‍රධානියා | B ගෘහපති |
| 3). ගමක ප්‍රධානියා | C මපුරුමුකා |
| 4). පරුමකවරුන්ගේ ප්‍රධානියා | D පරුමක |

1).ABCD 2). BCAD 3). CBDA 4). BDAC (......)

28) පහත සඳහන් සේවාවන් හා සම්බන්ධ රජවරු පිළිවෙළින් ගැළපූවිට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1). රෝහල් ඉදිකිරීම | A. පළමුවන උපතිස්ස රජතුමා |
| 2). මාතෘ නිවාස ඉදිකිරීම | B. පණ්ඩුකාභය රජතුමා |
| 3). සොත්ථිශාලා ඉදිකිරීම | C. පළමුවන විජයබාහු රජතුමා |
| 4). කාලිංග දේශය සමඟ සබඳතා පැවැත්වීම | D. බුද්ධදාස රජතුමා |

1). ABCD 2). BCAD 3). CBDA 4). DABC (......)

29) වැවක අංග මඟින් කෙරෙන කාර්යයන් නිවැරදිව පිළිවෙලින් ගැලපූවිට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1). පිටවාන | A වැවේ ජලය පාලනය කිරීම |
| 2). බිසෝකොටුව | B වැව් බැම්ම සේදී යාම වැළැක්වීම |
| 3). වැව් බැම්ම | C වැවේ අතිරික්ත ජලය පිට කිරීම |
| 4). සළපනාව | D වැවේ ජලය රඳවා ගැනීම |

1). ABCD 2). BCAD 3). CADB 4). DCAB (......)

30) පහත සඳහන් **"අ"** කොටසේ ඇති එක් එක් කර්මාන්තයන්හි නිරත වූවන් හැඳින්වූ පොදු නාමය **"ආ"** කොටස හා ගැලපූ විට පිළිතුර වන්නේ,

| | |
|---|---|
| 1). මැණික් හා අර්ධ මැණික් පිළිබඳ යෙදීම | A දයීක |
| 2). රන් කර්මාන්තයෙහි නියැලීම | B මණිකාර |
| 3).ඇත්දත් කර්මාන්තයෙහි නියැලීම | C කබර |
| 4). යකඩ වැඩවල යෙදීම | D තුලාධාර |

1). ABCD 2). BDAC 3). CDAB 4). DCAB (......)

31) ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය හොඳින් පැවති බවට පැහැදිලිව හඳුනාගෙන ඇති ප්‍රදේශයකි.
1). දකුණු පළාතේ මාගම
2). උතුරු පළාතේ නාගපදීපය
3). නැගෙනහිර පළාතේ දීඝවාපිය
4). සබරගමු පළාතේ සමනළවැව (......)

32) වැව් ප්‍රපතනය සඳහා වියළි කලාපීය ජනයා භාවිතා කළ නාමය වන්නේ,
1). ඔලගම් 2). එල්ලංගාව 3). නින්දගම් 4). විහාරගම් (......)

33) අතීතයේ පළාත් පාලනය සඳහා රජයට සම්බන්ධ වෙනම පරිපාලන ඒකක තිබූ බව පැහැදිලි කර ගැනීමට ඉඩ සලස්වන ලේඛනයකි,
1). වල්ලිපුරම් රන්පත් ලේඛනය.
2). පනාකඩුව තඹ සන්නසය.
3). සිතුල්පව්ව සෙල්ලිපිය.
4). පොළොන්නරුවේ ගල්පොත සෙල්ලිපිය. (......)

34) අතීතයේ ද්‍රවිඩ ජනතාවට වන්දනාමාන කිරීම සඳහා ගෝකණ්ණතිත්ථ වරායට ආසන්නව ඉදිකර තිබූ කෝවිල නම්,
1). තිරුකේතීෂ්වරම් කෝවිල 3). නල්ලූර්කෝවිල
2). කෝණේෂ්වරම් කෝවිල 4). කන්දස්වාමි කෝවිල (......)

35) ඈත කාලයක සිට අපේ රටේ නගරවල විවිධ සංස්කෘතියට අයත් ජනතාව වෙළෙඳාම කර ඇත. ඒ අනුව මලයානු අර්ධද්වීපයෙන් පැමිණි ජනයා හැඳින්වූයේ,
1). ග්‍රීක්වරු 3). කාම්බෝජවරු
2). අයෝනියන්වරු 4). ජාවකවරුන් (......)

36) අතීතයේ මැටි කර්මාන්තයේ දියුණුව විදහා දක්වන වර්ණාලේපිත උළු හමු වූ ස්ථානය නම්,

1). ජේතවන කැණීම් 3). මිරිසවැටි කැණීම්

2). අභයගිරි කැණීම් 4). ථූපාරාම කැණීම් (......)

37) ඉතිහාසයේ බදු නීතිය යටතේ අයකළ ප්‍රධාන බදු වර්ග අතරින් වැව්වල ජලය භාවිතා කරන්නන් ගෙන් අයකළ බදු හැඳින්වූ නාමය වන්නේ,

1). මතරමජිබක 3). බොජකපති

2). දකපති 4). උදකපනි (......)

38). ක්‍රි.ව.12 වන සියවස වන විට ශ්‍රී ලංකාවේ ප්‍රභූවරුන් අතර ජනප්‍රියව පැවති ආහාරයක් වූ සුවඳ ගිතෙලින් පිසූ මොනර මස් සහ ඇල් හාලින් සෑදූ බත් ලෙස සඳහන් වූ මූලාශ්‍රය වන්නේ,

1). සද්ධර්මරත්නාවලිය 3). බුදුගුණ අලංකාරය

2). සද්ධර්මරත්නාලංකාරය 4). සාරාර්ථ සංග්‍රහය (......)

පහත සඳහන් ප්‍රකාශ අධ්‍යයනය කර 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. රටේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමට දායක වීම.

B. පළමුවරට විශාල ප්‍රමාණයේ වැව් තැනීම.

C. අන්තර්ජාතික කලාපීය අවශ්‍යතාවලට මුහුණදීමට සාධනීය පියවර ගැනීම.

D. රුවන්වැලි සෑය ඉදිකිරීමට සම්බන්ධ වූ අයට සතරවාසල් දොරටුවේ දන්සල් දීම.

E. රාජකීය පවුලට රැකවරණ සැලැසූ බුදල්නාවන්ට කළගුණ සැලසීම පිණිස පනාකඩුව තඹ සන්නස කරවීම.

39). ඉහත සඳහන් ප්‍රකාශවලින් වසභ රජු හා සම්බන්ධ ප්‍රකාශ වනුයේ,

1). A හා B ය 2). B හා C ය 3). C හා D ය 4). D හා E ය (......)

40). ඉහත ප්‍රකාශ වලින් පළමුවන විජයබාහු රජුගේ සේවාවන් ඇතුළත් පිළිතුර වන්නේ,

1). A හා B ය 2). B හා C ය 3). D හා E ය 4). A හා E ය (......)

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]



## මතුගම අධ්‍යාපන කලාපය

### දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 10 ශ්‍රේණිය | විෂයය - ඉතිහාසය | පත්‍රය II | පැය - 02 යි. |

නම ..............................................................................................

**II පත්‍රය**

- **I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **II කොටසින් ප්‍රශ්න 5 ක් ද තෝරා ගෙන ප්‍රශ්න 6කට පිළිතුරු සපයන්න.**

01. (අ) I. පහත (i) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණුකොට නම් කරන්න.

(i) කලාඔය,මැණික් ගඟ, ගම්පල, ඉබ්බන්කටුව, සේනානායක සමුද්‍රය, ඉරණමඩු වැව, තිසා වැව, කතරගම,බුන්දල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ෆෙඩ්රික් කොටුව, ඌරාතොට.

(ලකුණු 12)

(ii) කැලිකට්, ජාවා දූපත, පර්සියන් බොක්ක, ටෝකියෝ, මියන්මාරය,හොවැංහෝ ගඟ. (ලකුණු 06)

(ආ) පහත A ,B , C ,D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු ආශ්‍රිත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිතා කළා යැයි සැලකෙන ගල් මෙවලම් පුරාවිද්‍යාඥයින් හඳුන්වා ඇති නාමය.

B. පුරාණයේ ආලකමන්ද්‍රධිපති මහරජු ලෙස සැලකූ රජතුමා

C. මීට අවුරුදු 2000 කට පමණ පෙර නීතිය පිළිබඳ දැනුමක් ඇති පුද්ගලයන් හඳුන්වන ලද්දේ කුමන නමකින් ද?

D. විශාල ප්‍රමාණයේ මැටි බඳුන් කිහිපයක් ළිඳ තුළට බස්සවා එහි බිත්ති ආවරණය කර සකස්කළ ළිං හඳුන්වනු ලැබූ නම කුමක්ද?

පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A

II). 1). A පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය නම් කරන්න.

2). මේවා හමුවී ඇති ස්ථානය සඳහන් කරන්න.

3). මෙම භාණ්ඩය සැකසීමට යොදාගනු ලැබූ උපකරණය කුමක්ද?

4). මෙම කාලයේදීම මෙවන්ම නිර්මාණයක් හමුවූ ස්ථානයක් සඳහන් කරන්න.



III). 1). මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමන ක්‍රියාවක් සිදුකරන පිරිසක්ද?
2). මෙම නිර්මාණය කුමන කාලවකවානුවකට අදින ලද්දක්ද?
3). මෙම චිත්‍රය දක්නට ලැබෙන ස්ථානය ලියන්න.
4). මෙහි දැක්වෙන ආහාර වර්ග දෙකක් නම් කරන්න.

## II කොටස

02).

I) අභිලේඛන යනු මොනවාදැයි හඳුන්වන්න. (ලකුණු 03)

II) සාහිත්‍ය මූලාශ්‍රවලින් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III) ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

IV) ශ්‍රී ලාංකිකයකු ලෙස පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර රැකගැනීමෙන් ඇති වැදගත්කම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

03).

I) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වූවා යැයි සැලකෙන
A. වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානයක් හා
B. කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 03)

II) ප්‍රාග් ඓතිහාසික යුගය, පූර්ව ඓතිහාසික යුගයෙන් වෙන්කර හඳුනාගැනීමට ඉවහල්වන සාධක දෙකක් ලියන්න. (ලකුණු 04)

III) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා උසස් තාක්ෂණයක් භාවිතකළ පිරිසක් බවට කරුණු දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

IV) මුල් ඓතිහාසික යුගයේ ජනවාස ව්‍යුහය හා ස්වරූපය කරුණු දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

04).

I) අතීතයේ රාජ්‍ය උරුමය හිමිවූ ආකාර තුනක් දක්වන්න. (ලකුණු 03)

II) ගමිකයන් ඉටුකළ කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 04)

III) පැරණි සමාජයේ ජනයා තමාගේ ආර්ථිකය සකස්කර ගත් ආකාර දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV) බුදුදහම මෙරට සමාජයේ මුල්බැසගත් අවධියේ මෙරට වෙනත් ආගම් පැවති බව නිදසුන් තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

05).

I) පහත සඳහන් වැව් කරවන ලද රජවරු අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - බසවක්කුලම වැව

B - මින්නේරිය වැව

C - පදවිය වැව (ලකුණු 03)

II) ශ්‍රී ලංකාව අතීතයේ අසල්වාසී රටවල් සමග සුහදශීලීව කටයුතු කළ අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 04)

III) මෙරට ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නඟා සිටුවීමට පැරණි පාලකයන් කටයුතුකළ ආකාරය උදාහරණ දෙකක් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV) අතීතයේ සිටම මෙරට අධ්‍යාපනය සංවිධානාත්මක ක්‍රමවේදයන් අනුව ලබා දී ඇති බව නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06).

I) වෙර යොදා බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවාගෙන මෙවලම් ගැනීමේ තාක්ෂණය හැඳින්වූ නාම කුමක්ද? (ලකුණු 03)

II) අතීතයේ මහවැව් තැනීමට පාදකවූ ප්‍රධාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III) මෙරට අතීත ජල කළමනාකරණය උසස් මට්ටමක පැවති බව සාධක දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV) පැරණි වාස්තු විද්‍යාව පිළිබඳ අංග රැසක් මෙරට අනුරාධපුර හා පොළොන්නරු රාජධානිවල දක්නට ලැබේ. ඊට අදාළ කරුණු 3ක් නිදසුන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

07).

I) මෙරට අතීත සමාජයේ බොහෝ කලක සිට ප්‍රභූති ලෙස සලකන ලද කණ්ඩායම් තුනක් නම් කරන්න. (ලකුණු 03)

II) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

A - කාසි අච්චු ගැසීමේ නිලධාරියා හැඳින්වූ නාමය

B - ශ්‍රී ලංකාවේ භාවිතා කළ විදේශීය කාසි වර්ග දෙකක් (ලකුණු 04)

III) පැරණි සමාජයේ කාන්තාවට උසස් හා ගෞරවාන්විත සැලකිලි ලැබුණු බව නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV) පැරණි කාලයේ විසූ පාලකයින් පරිසරය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම මනාව දැනසිටි බව සඳහා කරුණු 3ක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

**10 ශ්‍රේණිය ඉතිහාසය පිළිතුරු පත්‍රය**

**I කොටස**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1) - 2 | 2) - 2 | 3) - 2 | 4) – 2 | 5) – 3 | 6) – 2 | 7) – 2 |
| 8) – 1 | 9) – 4 | 10) – 2 | 11) – 1 | 12) – 4 | 13) – 2 | 14) – 1 |
| 15) – 2 | 16) – 4 | 17) – 3 | 18) – 1 | 19) – 4 | 20) – 2 | 21) – 4 |
| 22) – 1 | 23) – 4 | 24) – 3 | 25) – 1 | 26) – 2 | 27) – 4 | 28) – 4 |
| 29) – 3 | 30) – 2 | 31) – 4 | 32) – 2 | 33) – 1 | 34) – 2 | 35) – 4 |
| 36) – 2 | 37) – 2 | 38) – 1 | 39) – 2 | 40) – 4 | | |

**II කොටස**

01)
අ) සිතියම (ලංකා)
ආ) සිතියම (ලෝක)

(ආ)
A ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම්
B පළමුවන කාශ්‍යප රජතුමා
C වොහාර
D ඌරා කැට ලිං

1) මැටි වළඳක කොටස්
2) උඩරන්වමඩම
3) සක පෝරුව
4) හල්දුම්මුල්ල

1) ආහාර බුදින පිරිසක්
2) ක්‍රි.ව 19 සියවසේ දී
3) මුල්කිරිගල විහාරයේ
4) කෙසෙල්, තැඹිලි , හකුරු, පැණි

02)
I ගල්, මැටි පුවරු, බිත්ති, තඹ තහඩු, රන් තහඩු, දැව හා විවිධ භාජන ආදියෙහි ඇති පැරණි ලේඛන
II

- කාල අනු පිළිවෙළ සකස් කර ගැනීමට
- දේශපාලන ආර්ථික සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට
- එක් මූලාශ්‍රයකින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මඟින් සනාථ කර ගැනීමට
- රටක විදේශ සබඳතා අධ්‍යයනය කිරීම සඳහා

III

- තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය ලබා ගැනීමට
- අතීත අත්දැකීම් තේරුම් තේරුම්ගෙන අනාගතය ගොඩනගා ගැනීමට

- රටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීම
- විවිධ මත ඉවසීම

IV

- රටේ අභිමානය රැක ගැනීම
- විදේශ සබඳතා ගොඩනගා නැගීම
- අපේ සංස්කෘතිකය ආරක්ෂා කර ගැනීමට

03)

I A. මිනිහා ගල්කන්ද බුන්දල පතිරාජවෙල

B. බණ්ඩාරවෙල හෝර්ටන් තැන්න

II

- ස්ථිරවාසීතාව
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර
- මැටි වළං භාවිතය
- කෘෂිකර්මාන්තය ඇරඹීම

III

මැටි වලං සැකසීම - උඩ රංචමඩම

නිවාස ඉදි කිරීම - උඩරංචමඩම, හල්දුම්මුල්ල විස්තර කිරීම

IV ගංගා පිටත නිම්නවල බැව් කේන්ද්‍ර කේන්ද්‍ර කොටගෙන ජනාවාස ඉදිකිරීම.

වැව් ගම් - සුමනවාපිගාම, කඩහවාපිගාම

වෘත්තිකයන් අනුව ගම් - මණිකාරගාම, කේවට්ටගාම

විශාල නගර - පුර, පුරකමත, නුරුපුර

04)

I.

- පියාගෙන් පුතාට
- සහෝදරයාගෙන් සහෝදරයාට
- අග බිසවගේ පුත්‍රයාට

II

- පොදු කටයුතු වලට නායකත්වය ලබා දීම
- සියලු දෙනා වෙනුවෙන් තීරණ ගැනීම
- වැව් නඩත්තු කිරීම
- ජලය බෙදා හැරීම

III ගොවි තැන - ප්‍රධාන ජීවන වෘත්තිය ගොවිතැනයි.

- සතුන් ඇතිකිරීම ඇති කිරීම හෙවත් පශු පාලනය ඒ ආශ්‍රිතව සිදු කිරීම.
- හේන් ගොවිතැන (ගොඩගොවිතැන)
- වී ගොවිතැන සිදුකිරීම ( විස්තර කිරීම

කර්මාන්ත - ලෝහ කර්මාන්තය
උදා - මුතු ගල්ල සෙල් ලිපිය
තඹ ලෝහ
රන් අනුරාධපුර මාංගම පුරාවිද්‍යාත්මක කැණීම්
කුඹකර - මැටි කර්මාන්තය
වෙළඳාම - නගර ගැන ලිපි හේන් පිටි ගම්

IV වෙනත් ආගම් පැවති බව
- බ්‍රාහ්මණ ජනතාවන් විසූ බව
- ඉන්දියාවට ආසන්න වීම නිසා
- හින්දු ආගම දේවස්ථාන කෝපල්
- තිරුකේතීෂ්වරම් කෝනේශ්වරම්
- කතෝලික නිකායන්
- ඉස්ලාම් ආගම පැවති බවට සාධක

05)
I
A පණ්ඩුකාභය රජතුමා
B මහසෙන් රජතුමා
C

- II ක්‍රිස්තු වර්ෂ 114 – 136 කාලයේ දී පළමුවන ගජබාහු රජුගේ කාලයේ දී දකුණු ඉන්දියාවේ කේරළයට
- ගොස් පත්තිනි දේවාලයත් විවෘත කිරීමේ උත්සවයට සහභාගී වීම.
- භාතිකාභය රජු කළ රෝමානු ක දේශයට තානාපති නිලධාරි නැවීම
- චීන තාන්ත්‍රික දූත සබඳතා

III

- බුද්ධදාස රජතුමා - රෝහල් ඉදි කිරීම - වෙජ්‍යශාලා , වෙජ
- පස්වන මහින්ද රජතුමා නොයෙක් පළාත්වල රෝහල්වලට අවශ්‍ය පහසුකම් ලබාදීම
- උණ රෝගීන්ට රෝහල් ඉදිකිරීම හතරවන කාශ්‍යප රජතුමා
- ගැබිනි මවුවරුන් සඳහා රෝහල ඉදිකිරීම

IV අධ්‍යාපනය
සෙල්ලිපිවල අවරිය වෙනුවෙන් ගුරුවරුන් හඳුන්වා දීම
පිරිවෙන් ආශ්‍රිත අධ්‍යාපනය ලබා දීම
මහා විහාරය අභයගිරිය යන අධ්‍යාපනික මධ්‍යස්ථාන තිබීම
සාහිත්‍ය පොත් පත් ලියා තිබීම උදාහරණ දක්වන්න
සීගිරි කුරුටු ගී

06)

I පිඩන ශල්කනය

II

- ගංවතුර පාලනය
- නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම
- කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම

III

- වැව් තාක්ෂණය - කලා වැව, තිසා වැව
- පොකුණු ඉදිකිරීම - ජලය පිරිසිදු කිරීම
- මාදුරුඔය කැනීම් වලදී සාධක හමුවීම
- වැවක අංග තාක්ෂණය අනුව එක් කිරීම
- සීගිරිය ජල තාක්ෂණය

IV ගෘහ නිර්මාණ - බෞද්ධ ගොඩනැගිලි, දාගැබ්, බෝධිසර, පිළිමගෙවල් හා ආරාම වැනි උදාහරණ සහිත ව විස්තර කිරීම

07)

I ධනවත් වෙළඳ ප්‍රධානීන්, නාවික කපිත්තන්, වෛද්‍යවරු, ගුරු වරු

II A

B රෝම, ග්‍රීක

III

- චූල සීවලී දේවි ය - ලාහුගල පිහිටි නිලගිරි සෑය නිලගිරි සෑය කැණීම් වල දී හමු වීම
- කාන්තා ඔබට නිදහස් ජීවිතයක් රසවාහිනිය
- පරුමකලු සිටීම
- ලීලාවතී රැජින තෙවරක් රට පාලනය කිරීම

IV

- පැරණි කාලයේ විසූ පාලකයින් නීති රීති පැනවීම
- හතරවන මිහිඳු රජතුමා - අනුරාධපුර පුවරු ලිපිය
- පාංශු බාදනය වැලැක්වීම තුන් වන උදය රජු
- අනුරාධපුර බුද්ධන්නෙහෙල සෙල් ලිපිය
- සතුන් ආරක්ෂා කර ගැනීමට පස ආරක්ෂා කර ගැනීම ආදිය විස්තර කිරීම